'සාරි පොටේ' එල්ලීමෙන් නිමාවට පත් වූ ජනතා විමුක්ති පෙරමුණේ සමාජවාදී අරගලය

වර්ධනය වන්නා වූ සමාජ ආර්ථික අර්බුදයන් එසින් සමාජයේ පවතින සියළුම ආයතන දේශපාලන අර්බුදයට ලක් කරනු ලබයි. 1960 ගණන්වල මුල් භාගයේ වර්ධනය වුණු ධනේශ්වර ආර්ථික අර්බුදයේ ප්‍රතිඵලයක් වශයෙන් ඒ කාලයේ තිබුනු සමාජය දේශපාලන අර්බුදයකට ලක් විය. වාමාංශික පක්ෂ ධනේශ්වර පක්ෂ සමග සහාග දේශපාලනයට යොමු වූහ. එසේ කිරීම මගින් ඔවුහු ලාංකීය වැඩ කරන ජනතා කොටස් වල අයිතීන්ද පාවා දුන්හ. එයින් ඇතිවූ වමේ හිඩැස්ස පුරවා ශ්‍රූයේ ජනතා විමුක්ති පෙරමුණ යි. ධනේශ්වර කඳවුරෙන් පිටත පවතින ස්වාධීන වමේ බලවේගයක් ගොඩනැගිය යුතුය යන මතය අතරමග සමාදානයෙන් තොරව ඉදිරියට ගෙන යාමේ ප්‍රතිඵලයක් වශයෙන් වසර පහකටත් අඩු කාලයක් තුල දී රටේ ස්වාධීන සහ ප්‍රධාන වමේ බලවේගය ලෙස ජනතා විමුක්ති පෙරමුණ වර්ධනය විය.

සිරගෙදර සිටි කාලයේත්, ඉන් නිදහස් වූ පසුවත් මම රෝහණ විජේවීර සහෝදරයා සමග ඉතා සමීපව වැඩ කලෙමි. මා දන්නා අන්දමට ඔහු කියා සිටියේ අධිරාජ්‍යවාදයට හා ධනේශ්වර පන්තියට එරෙහිව ගෙන යන අරගලයේදී ධනේශ්වර පාලනවල ගැත්තන් බවට පත් නොවිය යුතු බවයි. ධනේශ්වර පන්තියේ සහාග ගැටවලට හසු නොවිය යුතු බවයි. ස්වාධීන වමේ බලවේගයක අරගලයක් තුළින් වැඩ කරන ජනතාවගේ පුළුල් ව්‍යාපාරයක් ගොඩනැගිය යු තු බවයි. එහෙත් 1989 රෝහණ සහෝදරයා මරා දැමුවාට පසු ඔහුගේ අදහස් වලට ඉඳුරාම පටහැනි ලෙස යමින් ධනේශ්වර පක්ෂ සහ ආණ්ඩු සමග සහාග හැදුවේත්, ඒවායේ ඇමැති පදවි ලබාගෙන වරප්‍රසාද සහ ඵල ප්‍රයෝජන භුක්ති වින්දේත්, දැන් හිඩෙන ජනතා විමුක්ති පෙරමුණත්, මෑත දී බිහි කර ගත් ජාතික නිදහස් පෙරමුණත් එකට සිටි කාලයේදී ම නොවේ ද?

ජාතික නිදහස් පෙරමුණ මුලදීම පවසා තිබුනේ ජනතා විමුක්ති පෙරමුණට අවුරුදු 43ක් තිස්සේ රාජ්‍ය බලය අල්ලා ගන්නට බැරි වූයේ ජනතාවගේ අවශ්‍යතාවන් හඳුනාගෙන ඒ අනුව වැඩ නොකිරීමත්, වැරැදි උපතුම අනුගමනය කිරීමත් නිසා බව ය. මෙය සත්‍යයක් දෝ ජනතා විමුක්ති පෙරමුණ 1990 ගණන්වල ජනතාව අතර වේගයෙන් ප්‍රචලිත වෙමින් පාර්ලිමේන්තුවේ ආසන 16 ක් ද දිනාගෙන වර්ධනය වෙමින් පැවති කාලයේ දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් සමග සහාග දේශපාලනයට පිවිසුනේ අවස්ථාවාදී ලෙස කෙටි කාලයකින් බලය අල්ලා ගැනීමේ අපේක්ෂාවෙනි. ජනතා විමුක්ති පෙරමුණ අනුග මනය කළ මෙම අවස්ථාවාදී පිළිවෙත, 1964 කාලයේ දී එදා පැවති වාමාංශික එක්සත් පෙරමුණ ධනේශ්වර සහාග යකට යාමේ දී අනුගමනය කරන ලද අවස්ථාවාදී පිළිවෙත මයි. මේ දෙකම, රෝහණ සහෝදරයාම පවසා තිබෙන අන්දමට වැඩ කරන ජනතාව පාවා දීම හැර අන් කිසිවක් නොවේ. සහාග දේශපාලනයට එරෙහිව යමින් දහස් ගණන් සහෝදර සහෝදරියන් එසින් ලෙයින්, කඳුලින්, දහදියෙන් ගොඩනංවන ලද ඒ කාලයේ තිබුණු ජනතා විමුක්ති පෙරමුණේ අරමුණ වූයේ මිනිසුන්ට මිනිසුන් ලෙස නිදහසේ ජීවත් විය හැකි සාධාරණ ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් ගොඩනැගීම නොවේද? ජනතා විමුක්ති පෙරමුණ සමිපදායික වමේ ව්‍යාපාරයෙන් වෙනස් වූයේ ඒ නිසා නොවේද? එහෙත් අද වන විට සිදු වී තිබෙන්නේ කුමක් ද? වම දකුණට හරවා ඔලුවෙන් සිටුවීම හෙවත් වම පාවා දීම නොවේද? මේ වන විට මෙවුන්ගේ එකම දේශපාලන ක්‍රියා මාර්ගය බවට පත් වී තිබෙන්නේ අවස්ථාවාදය හැර අන් කිසිවක් නොවේ.

ගමනක අවසානය

අද ජාතික නිදහස් පෙරමුණ සතුව ඇතැයි කියා සිටින ඊනියා වෙහිහාසික කාර්ය භාරය අළුත් යමක් නොවේ. 1948 න් පසු කාලයේ දී සිංහල ජාතිකවාදීන් කියා සිටියේද එම කාර්ය භාරයම ගැන යි. සුළු ජාතීන් එසින් සාමකාමීව සමාජ සාධාරණත්වය ඉල්ලා සිටි විටත්, ඉන් පසු බලය බෙදා හරින ලෙස ඉල්ලා සිටි විටත්, ආයුධ අතට ගන්නට පෙර ප්‍රජාතන්ත්‍රවාදී ලෙස වෙනම රාජ්‍යයක් ඉල්ලා සිටි විටත් පාලක පංතීන් එසින් කරන ලද්දේ රජයේ ආයුධ සහ මැර බලය යොදවා එම ඉල්ලීම් පොඩිපිටමි කර දැමීමට ක්‍රියාකිරීම යි. එසේ නැතිව දෙමළ ජනයාට ඔවුන්ගේ භාෂාවෙන් රජය සමග ගණුදෙනු කිරීමට සහ ඔවුන්ගේ වදිනෙදැ ජීවිත වලට අදාල කටයුතු කරගෙන යාමට තිබෙන අයිතිය ඔවුන්ට ලබාදීම හෝ ව්‍යවස්ථාවෙන් ඔවුන්ට ලබා දී ඇතැයි කියන අයිතීන් ප්‍රායෝගික ලෙස ක්‍රියාත්මක කිරීම නොවේ. සමාජ ප්‍රවණ්ඩත්වයට ලක් නොවී, පුද්ගල සහ ප්‍රජා ආරක්ෂාවෙන් යුතුව, ආත්ම ගරුත්වයෙන් යුතුව ඔවුන්ට ජීවත් විය හැකි අන්දමට ඔවුන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් ලබාදීම නොවේ. රටේ ධනේශ්වර සංවිධානය වෙනුවෙන් සියවස් ගණනාවක් පුරා සිය දිවි කැප කළ සහ තවදුරටත් එසේ කරමින් සිටින වතු කම්කරුවන්ගේ උප්පන්න සහතික පිළිබඳ ප්‍රශ්නයට වත් පූර්ණ විසඳුමක් ලබා දෙන්නට 1948 න් පසු මෙතෙක් රටේ බලයට පත්වුණු කිසිදු ආණ්ඩුවක් ක්‍රියා කොට නැත.

වෙනම රාජ්‍යයක් ඉල්ලීම සඳහා දේශපාලන පදනම සපයා තිබෙන ජාතික ගැටළුව දේශපාලන වශයෙන් විසඳන්නේ නැතිව සිංහල නොවන ජන කොටස් අතර නැති වී තිබෙන විශ්වාසය තහවුරු කරන්නේ, සමාජ සංහිඳියාව ඇති කරන්නේ, ජාතික සමගිය ගොඩනගන්නේ කෙසේද යන ප්‍රශ්නයට මොවුන් ගෙන් පිළිතුරක් නොලැබේ. සමාජ පීඩාවන්ට විසඳුම් ලබා ගත හැකි ආකාරයේ දේශපාලන හා නෛතික රාමුවක් නිර්මාණය කිරීමට සහ ඒ සඳහා අවශ්‍ය සමාජයීය සංස්කෘතික සහ ආකල්පමය වෙනස්කම් ඇති කිරීමට ක්‍රියා නොකොට, ඒ වෙනුවට මේ ප්‍රශ්ණ විසඳීම සඳහා පීඩිතයා පළමුව විනාශ කර දැමීය යුතු යැයි කියා සිටිය හැක්කේ පීඩකයා සමග පෙලගැසුණු සංවිධානයකට පමණකි. පීඩාවට පත්ව සිටින ජන කොටසක් පාගා දමන්නට පීඩකයින්ට අත දෙන සමාජවාදයක් තිබිය නොහැකිය. එසේ කරන සමාජවාදියෙක් සිටිය නොහැකිය.

අධිරාජ්‍යවාදීන් ලංකාවේ අභ්‍යන්තර කටයුතුවලට ඇඟිලි ගසන බව ජාතික නිදහස් පෙරමුණත්, ජනතා විමුක්ති පෙරමුණත්, ඔවුන්ගෙ ජාතික වාදී සගයිනුත් පවසා සිටිති. ලංකාවේ වෙනම රාජ්‍යයක් ඉල්ලා කරන යුද්ධය නිර්මාණය කළේත්, පවත්වාගෙන යන්නේත් අධිරාජ්‍යවාදී බලවේග විසින් බව ද ඔවුහු කියා සිටිති. වෙන්වීම සඳහා කරන අරගලය යුදමය වශයෙන් පරාජය නොකොට, රටේ ජාතික ප්‍රශ්නය විසඳීමටවත්, ජන කොටස් අතර සාමය සහ සංහිඳියාව ඇති කිරීමටවත් නොහැකි යයි ද ඔවුහු පවසති. අද පවතින ධනේශ්වර ගෝලීයකරණ ක්‍රියාවලිය තුළ බලවත් හැම රටක්ම වාගේ අන් රටවල අභ්‍යන්තර කටයුතුවලට ඇඟිලි ගසන බව සැබෑය. අධිරාජ්‍යවාදයේ පැවැත්ම රැඳෙන්නේ ඔවුන්ගේ යුද නිෂ්පාදන වඩා හොඳින් අලෙවි කර ගැනීම තුළයි. ඒ වෙනුවෙන් අධිරාජ්‍යවාදීහු රටක් තුළ පවතින ඕනෑම ප්‍රශ්නයක් උපයෝගී කර ගනිති. එසේ නම් කළ යුතුව ඇත්තේ අධිරාජ්‍යවාදීන්ට සහ අනෙක් කුමන්ත්‍රණකරුවන්ට උපයෝගී කර ගැනීමට අවස්ථාවක් නොලැබෙන ලෙස සාධාරණ ලෙසත්, යුක්තිසහගත ලෙසත්, සියළු ජන කොටස්වල ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් තහවුරු කරන ලෙසත්, අපේ රටේ අභ්‍යන්තර ප්‍රශ්න අප විසින් ම විසඳා ගැනීම නොවේද? එම ප්‍රශ්ණ එසේ විසඳා ලන ලෙස පාලක පන්තියට බලකර සිටීම නොවේද? කවර අඳුපාඩු තිබුනද එදා තිබුණ ජනතා විමුක්ති පෙරමුණට නම් මෙය අළුත් දෙයක් නොවීය. එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ සඳහන් අයිතීන් ක්‍රියාත්මක කරන ලෙස එදා අපි රජයට බලකර සිටියේ ඒ නිසාය. එහෙත් අද ඇත්තටම සිදු වී තිබෙන්නේ මීට ඉඳුරාම පටහැණි දෙයකි. ප්‍රශ්න විසඳුනොට බල කිරීම කෙසේ වෙතත් අද ජාතික නිදහස් පෙරමුණ සහ ජනතා විමුක්ති පෙරමුණ පාලක පන්තියේ න්‍යාය පත්‍රයේ සැබෑ කොටස්කරුවන් බවට පත්වී ජන කොටස්වල අයිතීන්වලට පා පහර දෙමින් සිටිති.

1997-98 කාලයේ දී රටේ බලය බෙදා ගන්නට රජය යෝජනා කළ විට ඊට විකල්ප යෝජනාවලියක්වත් ඉදිරිපත් නොකොට එම යෝජනාවෙන් රට දෙකඩ කරනු ඇතැයි පවසමින් ජනතා විමුක්ති පෙරමුණ ඊට විරුද්ධ විය. මේ අන්දමට රට යන් විට පාර්ලිමේන්තුවේ ආසන කිහිපයක් අත්කර ගැනීම සඳහා ජනතා විමුක්ති පෙරමුණ තමන්ගේ සමාජවාදී ආත්මය පාවා දුන්නා යැයි කීම නිවැරැදි ය. එමේ සිටි ජනතා විමුක්ති පෙරමුණ සිංහල බෞද්ධ ජාතිකවාදය වෙත ගමන් ගත්තේ ඒ ආකාරයටය. ධනේශ්වර ආණ්ඩු විසින් අනුග මනය කළ හා කරන ජනතා විරෝධී පියවරවලට විරුද්ධ වන ඕනෑම පුද්ගලයෙක් හෝ සංවිධානයක්, වෙනම රාජ්‍යයකට හෝ එල්ටීටීයට උදව් වෙනවා යැයි කියමින්, එම ආණ්ඩු ආරක්ෂා කිරීමට පූර්ණ සහයෝගය පළ කරන විට ධනේශ්වර සහාගයට එකතු වූ ජනතා විමුක්ති පෙරමුණ එදා සිටියේ අද ජාතික නිදහස් පෙරමුණ සිටින තැනය. සැබෑ සමාජවාදීන් හා ප්‍රගතිශීලීන් මේ මොහොතේ කළ යුත්තේ, මෙම යුද්ධයට එරෙහි වෙමින් ජාතික ගැටළුවට දේශපාලන විසඳුමක් සපයන ලෙස බල කර සිටීම නොවේද?

වෙනම රාජ්‍යයක් සඳහා ගෙන යන අරගලය අධිරාජ්‍යවාදීන්ගේ කුමන්ත්‍රණයක් යයි ජනතා විමුක්ති පෙරමුණත්, ජාතික නිදහස් පෙරමුණත් පවසති. මෙය සත්‍යයක් නම්, අධිරාජ්‍යවාදී රටවල් විසින් එල්ටීටීරය තහනම් නොකොට, එල්ටීටීයට අරමුදල් එකතු කිරීමට තහංචි නොපනවා, එල්ටීටීර ක්‍රියාකාරිකයින් අත්අඩංගුවට නොගෙන, නඩුදූ නොපවරා, එල්ටීටීයට වැට කඩොළු නොබඳ, එල්ටීටීරය හා සම්බන්ධ නැව් ගිල්වා දමන්නට ඉඩ නොදී, එම නැව්වලට ලංකාව අවට මුහුදු තීරයට ගොඩබැසීමට අවශ්‍ය පහසුකම් සලස්වා දී, උතුරු නැගෙනහිර එල්ටීටීර මිරිසත්ථානවලට පහර දීමට අවශ්‍ය බුද්ධිමය තොරතුරු නොසපයා, ගුවන් යානා ප්‍රහාරක මීසයිල වැනි ඉතා ප්‍රබල අවි ආයුධ එල්ටීටීරයට සපයා දීමට සහ මිල දී ගැනීමට ආධාර කළ යුතුව තිබුණි. එහෙත්, බටහිර රටවල් සහ ඉන්දියාව මීට ඉඳුරාම පටහැණි ලෙස ක්‍රියා කරමින් ලංකාවේ රජයට ලබා දුන්නේද, දෙමින් සිටින්නේද අසීමිත සහයෝගයකි. අනෙක් අතට, අධිරාජ්‍යවාදී කුමන්ත්‍රණවලට ලක් වෙන්න තරම් ලංකාවේ ක්‍රියාත්මක කොට තිබෙන අධිරාජ්‍ය විරෝධී වැඩ කටයුතු මොනවා ද? මේ සියල්ල කැටි කර ගත් විට පෙනී යන්නේ සියළු දෙනාටම වඩා එල්ටීටීරය දුර්වල කිරීමට සක්‍රීය වශයෙන් ක්‍රියා කොට තිබෙන්නේ ජනතා විමුක්ති පෙරමුණ හෝ, ජාතික නිදහස් පෙරමුණත්, අනෙක් සිංහල ජාතිකවාදී ව්‍යාපාරත් විසින් කුමන්ත්‍රණකාරීන් ලෙස හඳුන්වනු ලබන අධිරාජ්‍යවාදීන් විසින්ම බවයි.

1964 දී වම දකුණට හැරවූ සහාගය

අපේ රටේ වර්ධනය වී තිබෙන මෙම අර්බුදය ගැන එක් එක් න්‍යායයන්ට දොස් පැවැරීමෙන් පමණක් යහපතක් සිදු වෙන්නේ නැත. මෙම තත්වයට මඟ පාදා තිබෙන්නේ අප අතර තිබෙන දර්ශනයේ දිලිඳු භාවයත්, ආත්මාර්ථකාමීත්වයත්, පුද්ගලවාදී අවස්ථාවාදයත්, සියවස් පහකට ආසන්න කාලයක් තිස්සේ පවත්වාගෙන ගිය යටත් විජිතවාදී ආධිපත්‍යය විසින් අපේ මනස තුළ පුබලව ලෙස පැලපදියම් කොට ඇති යටත්විජිතවාදී මානසිකත්වයත් යැයි යන්න මගේ කල්පනාව යි. වැඩ කරන ජනතාවගේ අයිතීන් වෙනුවෙන් අවංක ලෙසත්, අවනත ලෙසත් පෙනී සිටිනවා නම්, ක්‍රියා කරනවා නම්, අපි සියළු දෙනාම ලතින් ඇමරිකාවේ, ඉන්දියාවේ, සෝපියලයේ වැනි රටවල ප්‍රගතිශීලී බලවේග විසින් කටයුතු කරනු ලබන ආකාරය හැදෑරිමි ඉතා උචිත යැයි මම සිතමි. විශේෂයෙන්ම එක් ජන කොටසකට පමණක් විශේෂ වරප්‍රසාද ලබා දෙන්නේ නැතිව, ඒ රටවල වසන සියළු ජන කොටස්වල හිදහස සහ අයිතීන් ආරක්ෂා කරන ආකාරය, බලය බෙදා හදා ගැනීමට ක්‍රියා කරන ආකාරය අධ්‍යයනය කළ යුතුයි. එවැනි ව්‍යාපාර විසින් ඒ රටවල වැඩ කටයුතු කරනු ලබන ආකාරය දෙස බැලූ විට, ජනතා විමුක්ති පෙරමුණත්, ජාතික නිදහස් පෙරමුණත් සිටින්නේ අධිරාජ්‍ය විරෝධී අරගලයේ මොන පැත්තේ දැයි යන්න හොඳින් පැහැදිලි කර ගත හැකි වේ.

ලයනල් බෝපගේ

People for Human Rights and Equality (PHRE) and Darebin Ethnic Communities Council (DECC)

invite you to a

Public Meeting

On Human Rights and Media Freedom in Sri Lanka

And in remembrance of Lasantha Wickrematunge
Editor, Sunday Leader & Winner, UNESCO World Press Freedom Prize 2009, Brutally assassinated in January 2009

And all other murdered or incarcerated journalists

Saturday 06 June 2009 at 3.30 pm for 4.00 pm start

An opportunity to meet with guest speakers at 3.30 pm with light refreshments served.



Bdg K, Theatre K3.09, Monash University Caulfield Campus (Melway Ref: 68 F1)

Guest Speakers:

Dr. Paikiasothy Saravanamuttu
Co convener Platform for Freedom, Executive Director, Centre for Policy Alternatives & distinguished human rights campaigner

Mr. J C Weliamuna
Co convener Platform for Freedom, Executive Director, Transparency International Sri Lanka, Attorney-at-Law & leading human rights and anti corruption activist

In Sri Lanka today, while civilians continue to be killed in the war zone, there is unchecked assault on human rights and democratic freedoms throughout the island.

A major casualty of the conflict is media freedom. The Sri Lankan media are either co-opted into the propaganda machinery of the regime or suppressed with extreme violence. The current government has now more than matched the LTTE's own dedication to eliminating dissent and dissenters.

The human rights situation in Sri Lanka needs the urgent attention of the global community. Left unchecked, the situation is set to deteriorate.

THE WORLD NEEDS TO ACT NOW TO PREVENT THIS HAPPENING!

For more information please contact: 0427 610 823 E-mail: contact@phre.org.au